# හිනාවෙන කොටියා තමිල් චෙල්වන් ගුවන් ප්‍රහාරයෙන් මරුතුරුළට





පිස්තෝලය ඉනේ ගහගෙන මියගිය කොටින්ට ආචාර පුදකරන චෙල්වන්

**කි**ලිනොච්චි තුරුවයිආරු ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන පෙළේ කොටි කඳවුරු සංකීර්ණයකට ගිය සතියේ 2 වන සිකුරාදා අළුයම හයට පමණ ශ්‍රීලංකා ගුවන් හමුදාව එල්ල කළ දරුණු ගුවන් ප්‍රහාරයකින් කොටි සංවිධානයේ දේශපාලන අංශ ප්‍රධානී එස්. පී. (සුප්පයියා පරම්) තමිල් චෙල්වන් ඇතුළු ප්‍රධානපෙළේ කොටි නායකයන් හය දෙනකු මියගිය බව ගුවන් හමුදා මාධ්‍ය ප්‍රකාශක ගෲප් කපිතාන් අජන්ත ද සිල්වා මහතා පැවසී ය.

ගුවන් හමුදාවේ ප්‍රහාරක ජෙට් ගුවන් යානා දෙකකින් එල්ල කළ මෙම ගුවන් ප්‍රහාරවලින් කොටි සංවිධානයේ අන්පුමනී ඇලෙක්ස්), මුහුදන්, නේතගි, අද්ගිවාල් සහ වහිකුමාරන් යන නමින් යුත් කොටිනායකයන් පස් දෙනෙකුද මියගොස් ඇතැයි ද ගුවන් හමුදා ප්‍රකාශකයා කීය.

මේ අතර එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මූලස්ථානයද තම සංවිධානයේ දේශපාලන අංශ නායක බ්‍රිගේඩියර් තමිල් සෙල්වම් ඇතුළු නායකයන් හය දෙනකු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රහාරවලින් මියගිය බව 3 වෙනි උදේ නිවේදනය කළා ය. මියගිය පසු චෙල්වම්ට කොටි සංවිධානය බ්‍රිගේඩියර් තනතුරක් පිරිනමා ඇත.

කිලිනොච්චියට දකුණු දෙසින් පිහිටි තුරුවයිආරු ප්‍රදේශයේ අන්තෝනියා කෝවිල අසල පිහිටි මෙම කඳවුර සංකීර්ණයේ තමිල් චෙල්වන් ඇතුළු ප්‍රධාන පෙළේ කොටි නායකයින් රැස්ව සිටින බවට විශ්වාස කටයුතු බුද්ධි ඔත්තුවක් මත කල්තියා තොරතුරු ලැබී ඇති අතර ගුවන් හමුදාවේ නියමු රහිත යානාවක් යවා ලබාගත් ඡායා රූපද නිරීක්ෂණය කිරීමෙන් ඒ බව තහවුරු කර ගෙන මෙම ගුවන් ප්‍රහාරය නිවැරදිව සැලසුම් කළ බව ඉහළ පෙළේ ගුවන් හමුදා ආරංචි මාර්ග සඳහන් කරයි.

මියගිය කොටි ලුතිනන් ඇලෙක්ස් නමැත්තා පසුගිය කාලයේ යාපනය මුහමාලේ හා නගර්කෝවිල් හමුදා ඉදිරි ආරක්ෂක වළල්ලට එල්ලකළ ප්‍රහාර මෙහෙය වූ කොටි සන්නද්ධ අංශයේ ඉහළම නායකයකු බව ද කියති.

මෙම ප්‍රහාරයෙන් කඳවුරේ තවත් කොටි පිරිසක් මියගොස් තවත් පිරිසක් තුවාල ලබා ඇති බව පැවසේ. එම තුවාල ලැබූ කොටි ත්‍රස්තවාදීන් කිලිනොච්චිය රෝහලට ඇතුළත් කර ඇති බවත්, ඔවුනට අවශ්‍ය ලේ ලබා ගැනීම සඳහා කිලිනොච්චිය ප්‍රදේශයේ වෙසෙන සාමාන්‍ය වැසියන් කොටි ත්‍රස්තවාදීන් විසින් බලහත්කාරයෙන් රැගෙන යනු ලබන බවත් උතුරෙන් ලැබෙන ආරංචිය.

♦ **රන්ජිත් ජයසුන්දර වවුනියාව**



චෙල්වන්ගේ මිනියට ආචාර පාන කොටිනායක ප්‍රභාකරන්. " අනේ මටත් ඉතින් ළඟදිම මේ ඉරණම ම තමා" යයි ඔහු සිතනවා නොඅනුමානය. පසෙකින් අඬා වැටෙන්නේ චෙල්වම්ගේ මව හා සොයුරියන්ය.

# තමිල් චෙල්වන්ගේ වතගොත...

**යා**පනය චාවකච්චේරි මිරුසුවිල් ප්‍රදේශයේ දී 1964 වසරේ උපත ලැබූ පරමු තමිල් චෙල්වන් කොටි සංවිධානයට බැඳී ඇත්තේ 1983 දී ය. ගිය සතියේ මියයන විට ඔහු 43 වන වියේ පසුවිය.

1994 වර්ෂයේදී පමණ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ දේශපාලන අංශයට එක්ව ඇති තමිල් චෙල්වන් මියයන අවස්ථාව වන විට එහි නායකයා වශයෙන් කටයුතු කරමින් සිටියේය. ඔහු මුලින්ම සන්නද්ධ අංශ නායකයෙකි. යාපනයේ සටන් වලට නායකත්වය දුන් ඔහු කොටි සංවිධානයේ දේශපාලන අංශය පිහිටුවූ විට එහි නායකයා විය.

කොටි නායක ප්‍රභාකරන්ගේ ඉතා විශ්වාසවන්තයකු වූ ඔහු වරෙක ප්‍රභාකරන්ගේ ආරක්ෂකයෙක්ද වූයේය. ලංකා හමුදා ප්‍රහාර වලින් කීපවරක්ම දිවි ගලවාගත් ඔහුට වරක් එල්ල වූ හමුදා ප්‍රහාරයකින් පාදයක් කැඩී ගියේය. ඉන් ඔහු ආබාධිතයෙක් විය.

සාම සාකච්ඡා සඳහා බැංකොක්, නෝර්වේ සහ ජපානයටද ගිය ඔහු කොටි සංවිධානයේ න්‍යායාචාර්ය හා ප්‍රධාන සාකච්ඡාකරුවකු වූ ඇන්ටන් බාලසිංහම් සමගද සාකච්ඡාවලට සහභාගි වූයේය. එසේම නෝර්වේ සාම නියෝජිත එරික් සොල්හයිම්, ජපාන නියෝජිත යෂුෂි අකාෂි ඇතුළු විදේශ නායකයන් සමග සාකච්ඡා පැවැත්වීමේ වගකීමද ප්‍රභාකරන් ඔහුට පැවරුවේ ය.

සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක කිරීමත් සමග නෝර්වේ සටන් නිරීක්ෂකයන්ද, ලංකා රජය හා වන්නියේ සාම කාර්යාල අතරද සම්බන්ධීකරණය ලෙස සිටියේ තමිල් චෙල්වන් ය. ඔහුගේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ නිතරම සිනහ මුසු මුහුණින් සිටීම ය.

තමිල් චෙල්වන්ගේ බිරිය ද කොටි සංවිධානයේ නායිකාවකි.

# දීඝවාපි ශුද්ධ භූමියේ ඉඩම් මංකොල්ලය

**දී**ඝවාපි ශුද්ධභූමියේ බෞද්ධ උරුමය විනාශකර දැමීම නතර කිරීමට දේශපාලනඥයින් හෝ අම්පාර මහ දිසාපතිවරයා හෝ පුරාවිද්‍යා කොමසාරිස්වරයා හෝ මේවන තුරු කිසිදු පියවරක් ගෙන නොමැත. දීඝවාපි ශුද්ධ භූමියට අයිති ඉඩම් බලෙන් අල්ලා ගැනීමට රජයද ඉඩදී ඇති අතර ඉඩම් බෙදාදීමේ නීතිවලට පටහැනිව මුස්ලිම්වරුන්ට ඉඩම් ලබාදීමට වරප්‍රසාද සලසා තිබේ. මුස්ලිම්වරු දීඝවාපි ඉඩම් වගා කිරීමට සහ ගැඩොල් කැපීමට යොදාගෙන සිටිති. ඔවුන් සමහර ඉඩම් බුල්ඩෝසර් මගින් හාරා බිඳ දමා පුරා වස්තු විනාශකර ඇති බව මනාව පෙනේ. මුස්ලිම්වරුන් විසින් ගෙන යනු ලබන මෙම ඉඩම් මංකොල්ලය ලංකාවේ මින් පෙර කිසි දිනක කිසි තැනක සිදු නොවූවකි.

මීට අවුරුදු කීපයකට පෙර බොදුහඬ පත්‍රයට ලිපියක් ලියූ පාර්ලිමේන්තු මන්ත්‍රී පුරාවිද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද හිමියෝ ඉතා වැදගත් අදහසක් ඉදිරිපත් කළහ. ඒ මෙසේ ය.


" බලය රැකගැනීමට ශ්‍රීලංකාවේ නිවට දේශපාලුවා ඕනෑම නිහීන ක්‍රියාවක් කිරීමට සූදානම් ය. ජාතියත්, රටත්, ආගමත්, භාෂාවත්, සංස්කෘතියත් හැඳිගෑවී ගියත් ඔහුට කමක් නැත. ඔහුට අවශ්‍ය එකම දෙය බලය රැකගැනීම හෝ බලය ලබාගැනීම පමණකි. මේ නිසා රටේ තත්වය දිනෙන් දින නරක අතට හැරෙමින් පවතී. දීඝවාපියට සිදුවී ඇත්තේද මෙයම ය. "

♦ **කමල් රාජපක්ෂ** Morden, Surrey, **UK**



මුස්ලිම්වරුන් විහාරයේ ඉඩම් හාරා පස්ගෙන ගොස් ඇති අයුරු



තමිල් චෙල්වම් ස්විට්සර්ලන්තයේ සාකච්ඡාවට ගිය අවස්ථාවේ එරික් සොල්හයිම්ට පොල් කැල්ල පෙන්නයි

# හිනාවෙන් ත්‍රස්තවාදය වැසේද?

## පරෙවියෙකු සේ පෙනුණු කොටියා

" **කෙ**නෙකුගේ හිනාව ඒ තැනැත්තාගේ හදවතට ඇතුල්වන දොරටුවයි." මෙහෙම ප්‍රකට කියමනක් බටහිර වැසියන් අතර තියෙනවා. ඒත් ඒක කාගේ කියමනක් ද කියල නම් මට දැන් මතක නැහැ. හිනාවෙත් ප්‍රභේද ගොඩක්.... කට පියාගෙන හිනා වෙනව. මහහඬින් හිනාවෙනව. හිකි හිකි ගාල හිනාවෙනව. කිසි සද්දයක් නැතුව දත් ටික හොඳට පෙන්නලා හිනාවෙනව. (පොල් කැල්ල පෙන්නනවයි කියන්නෙත් ඒකටමයි. පොල්කැල්ලත් සුදුපාටයි නේ) ඒ හිනාවට සමහරු කියනව **ටූත් පේස්ට් හිනාව** කියලත්. පත්තරවල දත්බෙහෙත් දැන්වීම්වලට දාලා තියෙන්නෙ ඒ හිනාව ඇති මූණක්. මට මතකයි ඉස්සර **සිළුමිණ** පත්තරේ **කෝල්ගේට්** ටූත්පේස්ට් දැන්වීමක දත්වහල්ල පෙන්නලා හොඳට කට ඇරලා හිනාවෙන තරුණියකගේ මුහුණක් සමග මෙහෙම ලියලා තිබුණා. " බය නැතුව සිනා සෙන්න... ඔබත් කොල්ගේට් දන්තාලේපය පාවිච්චිකරන්න...." ඒ හිනාව කෙලින්ම දත් බෙහෙත් ටික විකුණ ගන්න දාපු හිනාව.

ගිය සතියෙ කිලිනොච්චියෙ ගුවන් ප්‍රහාරයෙන් මැරිච්ච තමිල් චෙල්වන් කියන කොටි ත්‍රස්තවාදී සංවිධානයෙ ප්‍රකාශකයා ගැන නොයෙක් දෙනා කියපු දේවල් ගැන කියවද්දි සමහරු චෙල්වන්ගේ මුහුණෙ හැම තිස්සෙම තිබිච්ච හිනාව ගැනත් සඳහන් කරන්න අමතක කරලා නැහැ. එරික් සොල්හයිම් දුක් වෙනවලු චෙල්වන් මැරුණට. මිනිහ කියන්නෙ කොටි හමුදාවෙම ඔච්චරය හිනාවෙන මිනිහෙකුට හිටියෙ කියලා. (ඒ නොකිය කියන්නෙ අනික් සේරම මහ මුඩුමයො ටිකක් කියලා නේද?) තමිල්නාඩු මහ ඇමති කරුණානිධි අඬනව චෙල්වන් මැරුණට දුකට. ඒ මරණය මහ සහගහන අපරාධයක් බවයි මැන් කියන්නෙ. ඒ කතාව ගැන ජය ලලිතා බැනලා තිබුණා කරුණානිධිට, කොටින්ට ජැක්ගහන්නෙ ඇයි කියලා අහලා. ලංකාවෙ ඉන්න ලොකුම සාම වෙළෙන්දා වන ජෙහාන් පෙරේරා දුක්වෙනවා චෙල්වන් මැරුණයින් ලංකාවෙ සාම උදාකරගන්න තිබිච්ච හොඳම චාන්ස් එක නැතිවුනාය, චෙල්වන් කොටියි රජයයි සාමය නමැති පාරට යොමු කළ දූතයාය කියලා.

මේ කියපු දේවල් වලින් තේරිච්ච එක දෙයක් තමයි කවුරු කවුරුත් වගේ (මේ වෙලේගෙදර රාළ නම් නෙවෙයි ) චෙල්වන්ගෙ දත් තිස්දෙකම පෙන්නලා දාන හිනාවට රැවටිලා කියන එක. කොටි සංවිධානය චෙල්වන්ගෙ හිනාව ඉස්සරහට ගත්තෙ ඒකෙන් ජාත්‍යන්තර ප්‍රයෝජනයක් ගන්න. කවුරු මොන විදියෙ සැටිපිකේට් දුන්නත්, චෙල්වන් කියන්නෙ අනික් කොටි වගේම කිසිම හිතක් පපුවක් නැති අමුම අමු ත්‍රස්තවාදී කොටියෙක්. එච්චරයි.

චෙල්වන් වැඩිදුර ඉගෙන ගත්තු මිනිහෙක් නෙවෙයි, සාමාන්‍ය අධ්‍යාපනයක් ලබපු කෙනෙක්. ජීවිතේ පටන්ගත්තෙ බාබර් කෙනෙක් විදියට. 1983 දි කොටි සංවිධානෙට බැඳුණා. තමිල් නාඩුවලට ගිහිං යුද පුහුණුව ලැබුවා. ප්‍රභාකරන්ගෙ බොඩි ගාඩ් වෙලා ටික කාලයක් හිටියා. කමීසෙන් වැහිලා තිබුණට චෙල්වන්ගෙ බෙල්ලෙ සයනයිඩ් කරලක් තිබුණා. මැන්ගෙ ඉනේ පිස්තෝලයක් හැම තිස්සෙම. විදේශ නියෝජිතයෙක් කිලිනොච්චියට ආවොත් විතරයි ඒක ගලවන්නෙ.

ගිය අවුරුද්දෙ මුහමලෙයි වල කොටි රජයේ හමුදා සමග කළ සටනෙදි චෙල්වන් කොටි සාමාජිකයො යුද පිටියේ මෙහෙයෙව්වා. ඒඑක්කෙම මරෙන මොහොත දක්වා කොටිසංවිධානෙ හැම පහරදීමකටම චෙල්වන් සම්බන්ධව හිටියා. චෙල්වන් එක්ක මැරිච්ච අනෙක් ත්‍රස්තවාදි නායකයො ටිකත් එක්ක චෙල්වන් ඒ එළිවෙන ජාමෙ ප්‍රහාරය ලබපු කෑම්ප් එක ඇතුළෙ ලොකු ප්‍රහාරයක් සැළසුම් කරන්න එකට සාකච්ඡා කළා නම් මිනිහා කිසිදේකට සම්බන්ධ නැහැ කියන්න පුළුවන්ද? මරාගෙන මැරෙන කොටි පුහුණු කිරීමේදි හා ළමා සොල්දාදුවන් බඳවා ගැනීමේදි උන්ට අභ්‍යාස දේශන පවත්වලා තියෙන්නෙ චෙල්වන්. මේ සේරම දෙයින් ඔප්පු වෙනවද චෙල්වන් අමුම අමු කොටියෙක් මිසක් සාම පරෙවියෙක් කියලා? චෙල්වන්ගෙ හිනාවට මම හිතන්නෙ නැහැ බුද්ධියක් තියෙන මිනිස්සු රැවටේවි කියලා. මෙච්චර කල් හිටපු කොයි කොටියද හොඳ කොටියෙක් කියලා බදාගෙන ඉඹින්න පුළුවන් ?

♦ **වෙලේගෙදර රාළ London**